# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1953/2 - 2016 පෙබරවාරි මස 08 වැනි සඳුදා - 2016.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/24/2011

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

අංක 1924/29 දරන හා 2015.07.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් හාලි ඇල, ජයතිලක මාවත, අංක 44හි ආර්. ඩී. ධනපාල මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A3452 දරන හා 2015.03.12 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A3452 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2016.07.22 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**පළමුවන උපලේඛනය**

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

දිනය : 2016 ජනවාරි මස 11 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.

2015.07.22 දිනැති අංක *1924/29* දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දවූ ආර්. ඩී. ධනපාල සහ ලංකා විදුලිබල මණ්ඩලය බැඳී සිටින්නාවූ ද 2015.03.12 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීතිඥ ඒ. ආර්. කේ. වික්‍රමරත්න,
(වගඋත්තරකරු වෙනුවෙන්).

පිටපත :

ආර්. ඩී. ධනපාල මහතා,
අංක 44,
ජයතිලක මාවත,
හාලිඇල.

02-655

---

මගේ අංකය : IR/10/17/2011

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

අංක 1936/57 දරන හා 2015.10.16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් හබරණ, ලංකා විදුලිබල මණ්ඩලය, ග්‍රිඩ් උපපොළ හි පාලන මැදිරි ක්‍රියාකරුවන්ගේ සංගමය (පී. ගීත්සිරි පෙරේරා මයා වෙනුවෙන්) හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50හි

1 A – G 22993— 54 (2016/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A3495 දරන හා 2015.04.27 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් කාර්මික ආරවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A3495 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2016.10.16 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**පළමුවන උපලේඛනය**

**''අ'' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

දිනය : 2016 ජනවාරි මස 11 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.

2015.10.16 දිනැති අංක 1936/57 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූ පී. ගිත්සිරි පෙරේරා සහ ලංකා විදුලිබල මණ්ඩලය බැඳී සිටින්නාවූ ද 2015.04.27 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීතිඥ ඒ. ආර්. කේ. වික්‍රමරත්න,
(වගඋත්තරකරු වෙනුවෙන්).

පිටපත :

පී. ගිත්සිරි පෙරේරා මහතා,
අංක 159,
නව ගාලු පාර,
ගෝනදුව,
මොරොන්තුඩුව

02-656

මගේ අංකය : IR/15/08/2011

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.03.17 දිනැති හා අංක 1854/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.03.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පොල් කොටුව, කුඩා උඩුව, අංක 20හි පදිංචි එස්. දයානන්ද මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් පිටකෝට්ටේ, එපිටමුල්ල පාර, අංක 33හි පිහිටි කලම්බු කොමර්ෂල් කම්පැනි (ඉංජිනියර්ස්) ලිමිටඩ් (සංශෝධිත ලිපිනය - කලම්බු කොමර්ෂල් කම්පැනි (ඉංජිනියර්ස්) ලිමිටඩ්, අංක 20/7/ඒ, ඇවරිහේන පාර, කොළඹ 05) අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.01.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය.**

එස්. දයානන්ද,
අංක 20, කුඩා උඩුව,
පොල්කොටුව.

-ඉල්ලුම්කරු-

නඩු අංකය : A/3539 සහ

කලම්බු කොමර්ෂල් කම්පැනි,
(ඉංජිනියර්ස්) ලිමිටඩ්,
අංක 33, එපිටමුල්ල පාර,
පිටකෝට්ටේ.

සංශෝධිත ලිපිනය

කලම්බු කොමර්ෂල් කම්පැනි
(ඉංජිනියර්ස්) ලිමිටඩ්,
අංක 20/7/ඒ, ඇවරිහේන පාර,
කොළඹ 05.

-වගඋත්තරකරු-

අතර ඇති කාර්මික ආරවුල සම්බන්ධවයි

**තීන්දුව සහ ප්‍රදනය**

(01) ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණි ලොකුගේ මැතිතුමා විසින් එතුමාගේ අංක IR15/08/2011 සහ 2014.03.12 දින දරන ලිපිය මගින් ඉහත කී කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පහත නම් සඳහන් මා පත් කරන ලදී.

(02) එසේම ඉහත කාර්මික ආරවුලට පවත්නා කාරණය වශයෙන් කලම්බු කොමර්ෂල් කම්පැනි (ඉංජිනියර්ස්) ලිමිටඩ් හි සේවයේ නියුතු එස්. දයානන්ද මහතා ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමය යටතේ වන්දි ලබා ගැනීමට එකඟ වුවද එම වන්දි මුදල ලබා නොදීම සහ පොරොන්දු වූ පරිදි වන්දි මුදල් ගෙවනතෙක් වැටුප් නොගෙවීම නිසා ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේද යන්න සහ එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ යනුවෙන් කම්කරු කොමසාරිස් විසින් නිකුත් කර ඇති ඔහුගේ අංක අයි. ආර්. 15/08/2011 හා 2014.02.06 දිනැති ලිපියේ දක්වා ඇත.

(03) මෙම ආරවුල සම්බන්ධයෙන් පළමු පාර්ශවය විසින් අදාල පළමු ප්‍රකාශය ගොනු කල පසු වගඋත්තරකාර ආයතනයේ ලිපිනය පිළිබඳ ගැටලුවක් මතු වූ හෙයින් නැවත නඩුව 2014.07.11 දින කැඳවමින් 2014.07.25 ට පෙර අදල ප්‍රකාශ ගොනු කරන ලෙස වගඋත්තරකරුට දන්වා ඇත. අනතුරුව නඩුව 2014.08.05, 2014.09.01, 2014.10.07 සහ 2014.11.11 දින වලද කැඳවමින් වගඋත්තරකරුගේ කාර්යාලය සොයා ගැනීමට ඉල්ලුම්කරු ගොස් ඇති නමුත්, එය පැවති ස්ථානයේ නොපැවති බැවින් වගඋත්තරකරුගේ නිවැරදි ලිපිනය දන්වීමට කල් ඉල්ලා ඇත.

(04) පසුව ඉල්ලුම්කරු විසින් නිවැරදි ලිපිනයට නොතිසි නිකුත් කිරීමෙන් පසු වගඋත්තරකාර සමාගමේ මානව සම්පත් කළමනාකරු විසින් කාර්මික අධිකරණය වෙත 2014.11.25 දතමින් ලිපියක් එවමින් මෙම නඩු විභාගය සඳහා 2014.03.25 හෝ ඊට පසු එවන ලද ලිපි නොලැබුණු බවත් මින් ඉදිරියට මෙම නඩුව සඳහා පැමිණෙන බවත් දන්වා ඇත. අනතුරුව නඩුව 2015.01.12 දින නඩුව කැඳවා ඇති අතර එදින වගඋත්තරකාර ආයතනය විසින් අනිවාර්යයෙන්ම මීළඟ දිනයේදී පළමු ප්‍රකාශය පිටපත් තුනකින් (03) යුක්තව ගොනු කල යුතු බවට නියෝග කරමින් නඩුව 2015.02.23 දිනට කල් තබා ඇත.

(05) 2015.02.23 දිනට මෙම නඩුවේ දෙපාර්ශ්වය පෙනී සිටින ලද අතර එහිදී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා මෙම නඩුව සම්බන්ධව අදළ ලේඛන නොලැබුණු බැවින් පළමු ප්‍රකාශය එදින ගොනුකළ නොහැකි බැවින් වෙනත් දිනයක් ඉල්ලා සිටින ලදුව නඩුව 2015.03.30 දිනට කල් තබා ඇත.

(06) 2015.03.30 දින නඩුව කැදවූ අවස්ථාවේ වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මොහොමඩ් හෂීර් මහතා පළමු ප්‍රකාශය ඉදිරිපත් කිරීමෙන් පසු එහි පිටපතක් ඉල්ලුම්කරුට ලබා දෙමින් ඔහුගේ දෙවැනි ප්‍රකාශය ගොනු කිරීමට 2015.05.25 දිනට කල් තබා ඇත.

(07) ඒ අනුව 2015.05.25 වැනි දින කැදවූ අවස්ථාවේ ඉල්ලුම්කාර පාර්ශ්වයේ දෙවන ප්‍රකාශය ගොනු කල අතර එහි පිටපතක් වගඋත්තරකාර පාර්ශ්වයට ලබා දී ඇත. එසේම එදින නඩුව සම්බන්ධයෙන් සමථයක් ඇත්දැයි බේරුම්කරණය විසින් දෙපාර්ශ්වයෙන් විමසන ලදුව ඉල්ලුම්කාර පාර්ශ්වය කියා සිටියේ මෙම නඩුවේ යොමුවේ දන්වා ඇති පරිදි රුපියල් හත් ලක්ෂය (රු. 700,000) ක මුදලක් වගඋත්තරකාර සමාගමෙන් ලැබීමට ඇතත් රුපියල් හාර ලක්ෂය (රු. 400,000) ක මුදලක් ලබා දෙන්නේ නම් නඩුව සමථයට පත් කර ගැනීමට කැමති බවයි. එම අවස්ථාවේ දී එකී සමථය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයට කරුණු දැක්වීම සඳහා දිනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිය හෙයින් ඒ අනුව නඩුව සමථය හෝ විභාගය සඳහා 2015.07.20 දිනට කල් දමා ඇත.

(08) අනතුරුව නඩුව 2015.07.20 දින කැදවූ අවස්ථාවේදී දෙපාර්ශවය පෙනී සිටින ලද අතර මෙම නඩුවේ පූර්ණ සහ අවසාන සමථයක් වශයෙන් රුපියල් දෙලක්ෂය (රු. 200,000) ක මුදලක් ගෙවීමට වගඋත්තරකාර පාර්ශ්වය කැමති බව දන්වන ලද අතර එම තීන්දුව පිළිගන්නා බව ඉල්ලුම්කාර පාර්ශ්වය දැනුම්දීමෙන් පසුව මුදල් ගෙවීම සඳහා 2015.08.12 දිනට කල් දමමින් මෙම සමථය ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධයෙන් අගතියක් නොවන බවද දන්වා ඇත.

(09) බේරුම්කාර මා අසනීප වීම නිසා එකී 2015.08.12 වැනි දින නඩුව කැදවා නොමැති අතර 2015.08.26 වැනි දිනට කල් දමා ඇත. ඉහත කී සමථය පරිදි රුපියල් දෙලක්ෂය (රු. 200,000) ක මුදලක් 2015.08.26 දින ඉල්ලුම්කාර පාර්ශ්වයට වගඋත්තරකාර පාර්ශ්වය විසින් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් බේරුම්කරණය ඉදිරියේ ගෙවීමෙන් මෙම ආරවුල සමථයකට පත් කර ගන්නා ලදී.

මේ අනුව මෙම ආරවුල පූර්ණ සහ අවසාන වශයෙන් සමථයක් වී ඇති බවට මෙයින් සටහන් කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත සමථයක් බවට මම සලකමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2016ක් වූ ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

02-657

මගේ අංකය : IR/10/14/2010

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

අංක 1943/15 දරන හා 2015.12.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් මහනුවර, කඩුගන්නාව, කුරුඳුවත්ත, අංක 184හි එන්. ආර්. බී. සමරනායක මය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A3416 දරන හා 2015.05.08 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් කාර්මික ආරවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A3416 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2016.12.03 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**පළමුවන උපලේඛනය**

**''අ'' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

දිනය : 2016 ජනවාරි මස 11 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.

2015.12.03 දිනැති අංක *1943/15* දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දවූ ද එන්. ආර්. බී. සමරනායක සහ ලංකා විදුලිබල මණ්ඩලය බැඳී සිටින්නාවූ ද 2015.05.08 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීතිඥ ඒ. ආර්. කේ. වික්‍රමරත්න,
(වගඋත්තරකරු වෙනුවෙන්).

පිටපත :

එන්. ආර්. බී. සමරනායක මහතා,
අංක 184ඒ,
කුරුඳුවත්ත,
කඩුගන්නාව,
මහනුවර.

02-658

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.